# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 5 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 පෙබරවාරි මස 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : 10.00 යි.

# 2011 අංක 5 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 23/2007.

## 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක 5 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට පූර්විකාවක් ඇතුළත් කිරීම මගින් එම පනත සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ දීර්ඝ නාමයට ඉක්බිතිව ම පහත දැක්වෙන පූර්විකාව ඇතුළත් කිරීම මගින් එකී පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> "සියලු තැනැත්තන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස මුළුමනින් ම සපුරාලීම සඳහා සහාය වීමේ රජයට ඇති කාර්යභාරය ද ; සාධාරණ යුක්ති ධර්මය මගින් පාලනය කරනු ලබන සමාජ ක්‍රමයක් ලබා දීම මගින් ජනතාවගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ද ; ජනතාවට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් ඇති කළ යුතු බව පිළිගැනීම සහ එය සපුරාලීම සඳහා සහාය වීම සහ ජනතාවගේ සදාචාරමය සහ සංස්කෘතිකමය තත්ත්වය වැඩිදියුණු කිරීම සහ එමගින් මානව පෞරුෂත්වයේ පූර්ණ වර්ධනය තහවුරු කිරීම යන කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ් වී ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම මගින් පිළිගෙන ඇති හෙයින් ද ;
>
> වැඩිහිටි තැනැත්තන්ට ගරු කිරීම සහ සැලකිලි දැක්වීම මගින් රජය විසින් රැකවරණය සැලසිය යුතු සහ ආරක්ෂා කළ යුතු කණ්ඩායමක් වශයෙන් වැඩිහිටි තැනැත්තන් රජය විසින් පිළිගනු ලබන හෙයින් ද ;
>
> වැඩිහිටියන් විසින් සමාජයට ලබා දී ඇති දායකත්වය අගයන 1991 දෙසැම්බර් මස 16 වන දිනැති අංක 46/91 දරන එක්සත් ජාතීන්ගේ යෝජනා සම්මතය ශ්‍රී ලංකාව විසින් පිළිගෙන තහවුරු කර ඇති හෙයින් ද, වයස්ගත වන වැඩිහිටියන්ට සමාජමය වශයෙන්, ආර්ථික වශයෙන්, ශාරීරික වශයෙන් සහ ආධ්‍යාත්මික වශයෙන් සෞඛ්‍යසම්පන්න වූ ජීවිතයක් සඳහා රජය විසින් අවශ්‍ය යටිතල පහසුකම් සැපයිය යුතු බව රජයේ අදහස වන හෙයින් ද ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ;"

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයේ "සභාවේ උපසභාපතිවරයකු ලෙස පත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "සභාවේ පූර්ණකාලීන උපසභාපතිවරයකු ලෙස පත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා සභාවේ ලේකම්වරයා විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ —

(1) (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඌ) රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවාවන්හි දී වැඩිහිටියන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ සහ අනුග්‍රහ සෑම වැඩිහිටි තැනැත්තකුටම ලබා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම ;

(එ) සියලු ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, දිස්ත්‍රික්කවල සහ පළාත් සභා සීමාවල වැඩිහිටි කමිටු පිහිටුවීම ;

(ඒ) වැඩිහිටි තැනැත්තන්ගේ ප්‍රශ්න විසඳීමේ දී ඔවුන්ට ආධාර කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ ප්‍රශ්න පිළිබඳ දැනුමක් ඇති සමථ කිරීමේ නිලධරයන් පත් කිරීම ;

(ඔ) වැඩිහිටි තැනැත්තන්ට සලකන තැනැත්තන් අතර වෘද්ධ විද්‍යාව සහ වෘද්ධ චිකිත්සාව යන විෂයයන් පිළිබඳ දැනුම පතුරුවාලීම ; සහ



(2) (ඌ) ඡේදය, (ඕ) ඡේදය ලෙස නැවත අකුරු යෙදීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (3) වන උපවගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ :—

"(3)(අ) යම් ගාස්තුවක් ගෙවා හෝ අන්‍යාකාරයකට යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට හෝ ආයතනයකට ප්‍රවේශ වීම හෝ ඒ ගොඩනැගිල්ල, ස්ථානය හෝ ආයතනය භාවිත කිරීම හෝ සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකුට පනවා නොමැති වගකීමක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් වයස අනුව වැඩිහිටි තැනැත්තකුට පැනවීම කවර හෝ තැනැත්තකු විසින් සිදු නොකළ යුතු ය.

(ආ) යම් ගාස්තුවක් ගෙවා හෝ අන්‍යාකාරයකට වෙනත් යම් තැනැත්තන් විසින් භාවිත කරනු ලබන හෝ භුක්ති විඳිනු ලබන හෝ ඒ තැනැත්තන්ට ලබා දෙනු ලබන පහසුකමක්, ප්‍රතිලාභයක්, වාසියක් හෝ සේවාවක් වැඩිහිටි තැනැත්තකු විසින් භාවිත කිරීම හෝ භුක්ති විඳීම හෝ එම පහසුකම, ප්‍රතිලාභය, වාසිය හෝ සේවාව ලබා ගැනීම එම වැඩිහිටි තැනැත්තාගේ වයස අනුව කවර හෝ තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සභාව වෙත ලියාපදිංචි වීම.

16. (1) වැඩිහිටියන්ට නේවාසික සත්කාරය සපයනු ලබන ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යන ස්වේච්ඡා හෝ අන්‍යාකාරයක සෑම තැනැත්තකු හෝ සංවිධානයක් විසින් ම ඒ ආයතනය වැඩිහිටි තැනැත්තන් පස් දෙනකුට වඩා නේවාසිකව සිටින ආයතනයක් වන්නේ නම්, මේ පනතේ දැක්වෙන විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු හෝ සංවිධානයක්, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2අ) සභාව විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන යම් ලේඛනයක් හෝ වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට 16 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු හෝ සංවිධානයක් වෙත නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මණ්ඩල එකක් හෝ වැඩි ගණනක් මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "නීතිය, කළමනාකරණය, මානව හිමිකම්, සමාජ සේවා, වෛද්‍ය වෘත්තිය හෝ උපදේශනය යන ක්ෂේත්‍රවල දැනුම හා පළපුරුද්ද ඇති ප්‍රවීණ හා විශ්වාසනීය තැනැත්තන් සාමාජිකයන් වන මණ්ඩල එකක් හෝ වැඩි ගණනක්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය .". යන වචන ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"සමථ කිරීමේ නිලධරයා.

24අ. (1) සභාව විසින් පත් කරන ලද සමථ කිරීමේ නිලධරයකු මණ්ඩලය විසින් තමා වෙත යොමු කරන ලද ඕනෑම නඩත්තු හිමිකම් පෑමක් සමථයකට පත් කළ යුතු ය.

(2) සමථ කිරීමේ නිලධරයකු වෙත යොමු කරන ලද යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සමථයකට එළඹිය නොහැකි අවස්ථාවක දී ඔහු විසින් එම කරුණ මණ්ඩලය වෙත යොමු කළ යුතු ය.

(3) සමථ කිරීමේ නිලධරයකු තෝරා ගැනීමේ දී අනුගමනය කළ යුතු සුදුසුකම් සහ නිර්ණායක සභාව විසින් තීරණය කළ යුතු ය .".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—



"(2) මණ්ඩලය විසින් නඩත්තු මුදල් ප්‍රදානය කිරීමේ දී —

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අවම මුදලක් නිශ්චය කරනු ලැබිය හැකි යම් බැංකුවක තැන්පත් කරන ලෙස ; හෝ

(ආ) එවැනි අවම මුදලක වටිනාකමකින් යුතු වාර්ෂිකයක් රක්ෂණකරුවකුගෙන් මිල දී ගන්නා ලෙස ;

වගඋත්තරකරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) වගඋත්තරකරු විසින් (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු වෙත ගෙවිය යුතු වූ මුදල වගඋත්තරකරුගේ වැටුපෙන් අඩුකර ඒ මුදල ඉල්ලුම්කරුගේ බැරට යවන ලෙස මණ්ඩලය විසින් වගඋත්තරකරුගේ සේවා යෝජකයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.".

(2) එහි (3) වන උපවගන්තිය, එහි (4) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.